(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 91.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2021 අගෝස්තු 17 අඟහරුවාදා පූ. භා. 10.00 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැව්ලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කපිල අතුකෝරල** මහතා

ගරු **සම්පත් අතුකෝරල** මහතා

ගරු **තිස්ස අත්තනායක** මහතා

ගරු **හෙක්ටර් අප්පුහාමි** මහතා

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන** මහතා

ගරු **මායාදුන්න චින්තක අමල්** මහතා

ගරු **එම්. උදයකුමාර්** මහතා

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර** මහතා

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ** මහතා

ගරු **සංජීව එදිරිමාන්න** මහතා

ගරු **ලලිත් එල්ලාවල** මහතා

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන්** මහතා

ගරු **සාගර කාරියවසම්** මහතා

ගරු **ෆයිසාල් කාසිම්** මහතා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල** මහතා

ගරු **උදයන කිරිඳිගොඩ** මහතා

ගරු **ගෙවිඳු කුමාරතුංග** මහතා

ගරු **අ. අරවින්ද් කුමාර්** මහතා

ගරු **වේලු කුමාර්** මහතා

ගරු **කරුණාදාස කොඩිතුවක්කු** මහතා

ගරු **නාලක බණ්ඩාර කෝට්ටේගොඩ** මහතා

ගරු **ඩයනා ගමගේ** මහත්මිය

ගරු **(වෛද්‍ය) උපුල් ගලප්පත්ති** මහතා

ගරු **උදයකාන්ත ගුණතිලක** මහතා

ගරු **කෝකිලා ගුණවර්ධන** මහත්මිය

ගරු **යදාමිණී ගුණවර්ධන** මහතා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්** මහතා

ගරු **නලින් බණ්ඩාර ජයමහ** මහතා

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන** මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන: කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද 'මුදල්'නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පතේ සියලුම විධිවිධාන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරීක්ෂා කර 4(1), 5(1), 5(2), 5(3), 5(4), 5(5), 6(1), 7(1), 12(b), 13(1), 14 සහ 20 වගන්තිවලට යෝජනා කරන ලද සංශෝධන ද, 17 වගන්තිය මුළුමනින් ඉවත් කිරීම ද, මත ක්‍රියාත්මක වේ නම්, පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ වගන්ති කිසිවක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

මෙම තත්ත්වයන් යටතේ, පනත් කෙටුම්පතේ ඉහත කී වගන්ති ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් කර ඇති පරිදි සංශෝධනය කරන්නේ නම්, පාර්ලිමේන්තුවේ සරල බහුතරයෙන් පනත් කෙටුම්පත සම්මත කළ හැකි ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

II

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 අගෝස්තු 16 දින මා විසින් 'සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

III

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ)' නමැති පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම: (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XV කොටස; සහ

(ii) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVII හා XXVIII කොටස්, සිව්වැනි කාණ්ඩයේ XIII කොටස සහ හයවැනි කාණ්ඩයේ XXIV හා XXV කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය මත** තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ ශ්‍රී ලංකාවේ අපජල කළමනාකරණයේ කාර්යක්ෂමතාවය ඇගයීම සම්බන්ධ විශේෂ විගණන වාර්තාවේ - IV කොටස; සහ

(ii) නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාවේ - V කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය මත** තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුව වාර්ෂික කාර්ය සාධන වාර්තාව වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 27 දිනැති අංක 2216/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ධීවර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(iii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි

පිළිගන්වා එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය මත** තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

3. කාරක සභා වාර්තා පිළිගැන්වීම: (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) (52 අධිකාරය වන) සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන්;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්;

(iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියමය;

(v) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝග;

(vi) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝග; සහ

(vii) (235 අධිකාරය වන) රේගු ආඥාපනත යටතේ යෝජනා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ඩග්ලස් දේවානන්දා මහතාගේ වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2017 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(iii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු මහින්ද අමරවීර මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2017 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත;

(ii) 2018 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2019 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2019 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

4. මහජන පෙත්සම් පිළිගැන්වීම:

(1) (i) පොළොන්නරුව, ඇල්ලේවැව, ඉහළ ඇල්ලේවැව, අංක 213 දරන ස්ථානයෙහි පදිංචි එල්. ඒ. සෝමලතා කාන්ති මහත්මියගෙන් ලැබුණු 2021.06.21 දිනැති පෙත්සම; සහ

(ii) කොළඹ 15, මට්ටක්කුලිය, විස්වයික් පාර, අංක 206/5 දරන ස්ථානයෙහි පදිංචි එම්. වයි. එම්. සකීර් මහතාගෙන් ලැබුණු 2021.05.10 දිනැති පෙත්සම

ගරු තිස්ස අත්තනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කුරුණෑගල, කවුඩාවත්ත, සහබන්දු වත්ත, අංක 272/2 දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. ඒ. ටී. චම්පිකා මහත්මියගෙන් ලැබුණු 2021.06.08 දිනැති පෙත්සම ගරු අනුර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) හොරොව්පොතාන, මරදන්කඩවල, අලුත්වත්ත, සමාධි මාවත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ආර්. ජීවකරත්න මහතාගෙන් ලැබුණු 2021.04.05 දිනැති පෙත්සම ගරු උද්දික ප්‍රේමරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(4) වෙයන්ගොඩ, අලවල, රජමහ විහාර පාර, අංක 142 දරන ස්ථානයෙහි පදිංචි ඊ. ඩී. සෝමරත්න මහතාගෙන් ලැබුණු 2021.07.07 දිනැති පෙත්සම ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) කොළඹ 06, වැල්ලවත්ත, පීටර්සන් පාර, අංක 43, 5/1 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රියන්ත උදය කුමාර මහතාගෙන් ලැබුණු 2021.05.03 දිනැති පෙත්සම ගරු මධුර විතානගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) අවිස්සාවේල්ල, කොළඹ පාර, සීතාලෙන මාවත, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි එච්. දම්මිකා ප්‍රේමානන්ද මහත්මියගෙන් ලැබුණු 2021.07.02 දිනැති පෙත්සම ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 සැප්තැම්බර් 06 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 සැප්තැම්බර් 06 දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2021 සැප්තැම්බර් 06 සඳුදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල සහ 2020 අගෝස්තු 27 දින සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම පිණිස පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු

පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසිඑක් දෙනෙකුගෙන් (21) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 සැප්තැම්බර් 06 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා.12.13 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා.1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.24 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.03 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "තිබිය යුතු අතර, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම තැනැත්තා එම කොවිඩ්-19 සම්බන්ධිත";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 10 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''2020 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති; හෝ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 සහ 21 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''දෙමින්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 16 වැනි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''ඉදිරියේ දී සිදු කර අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක දී,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 4 වැනි පිටුවේ 23 වැනි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''කිරීමෙන් අනතුරුව එම විකල්ප අධිකරණයේ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් එම මුල් අධිකරණය වෙත මාරු කරනු ලැබිය'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 3 වැනි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''ඉදිරියේ දී සිදු කර අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක දී,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"4. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මුල්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කටයුත්ත, දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් නිර්මාණය කරනු ලබන සජීවී වීඩියෝ හෝ සජීවී රූපවාහිනී සබැඳියක් මඟින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් මුල් අවස්ථා අධිකරණයක් ඉදිරියේ සිදු කරනු ලබන යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක දී -

(අ) 2021 ජනවාරි මස 29 වන දිනැති අංක 2212/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීතිවල;

(ආ) 2021 පෙබරවාරි මස 23 වන දිනැති අංක 2216/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අභියාචනාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීතිවල; සහ

(ඇ) දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි වෙනත් යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක හෝ අභියාචනාධිකරණ රීතියක,

විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, හැකිතාක් දුරට අදාළ කරගනු ලැබිය යුතුය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වැනි පිටුවේ 22 සහ 23 වැනි පේළි ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

5 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 27 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

7 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 7 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 34 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය

වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

8 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 9 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 23 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"IV වන කොටස";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

9 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 9 වැනි පිටුවේ 26 සහ 27 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"9. මේ පනතේ 2 වන වගන්තිය යටතේ සහනයක් ලෙස බැහැර කරන ලද යම්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 11වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

10 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"10. 2 වන වගන්තියේ කාර්යය සඳහා නියම කරන ලද කාලසීමාවන්ට අනුකූලවීමට නොහැකි වීම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

11 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 26 වැනි පේළියේ සිට 35 වැනි පේළිය දක්වා වූ පේළි(එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 11 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 8 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

12 වැනි වගන්තිය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා වූ පේළි(එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 11 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(අ) කොවිඩ් - 19; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් තත්ත්වයන්ගෙන් පැන නගින හෝ ඊට ආනුෂංගික වෙනත් යම් තත්ත්වයක්,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 12 වැනි පිටුවේ 4 වැනි පේළියේ සිට 9 වැනි පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

13 වැනි වගන්තිය සභා සම්මත විය.

පළමුවැනි උපලේඛනය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12, 13, 14, 15 සහ 16 වැනි පිටුවල පළමු උපලේඛනය ඉවත් කිරීමට.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''පළමුවැනි උපලේඛනය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙන් ඉවත් කළ යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

දීර්ඝ නාමය

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ දීර්ඝ නාමයෙහි පහත දැක්වෙන වචන ඉවත් කිරීමට:—

''කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට නොහැකි වූ ඇතැම් ගිවිසුම්වල පාර්ශ්වයන් සම්බන්ධයෙන් සහනයක් ලබාදීම සඳහා ද'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් ලෙස තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අලුත් වගන්ති

අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 25 වැනි ජේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් පිළිබඳව වන මාර්ගෝපදේශ ආදිය බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස සලකනු ලැබිය යුතු බව

11. (1) යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් පිළිබඳව රජය විසින් සාදන ලද මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වන යම් මාර්ගෝපදේශයක්, විධානයක්, චක්‍රලේඛයක්, දැන්වීමක් හෝ තීරණයක් මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක දී, ඉල්ලීමක දී, අභියාචනයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී තවදුරටත් ඔප්පු කිරීමකින් තොරව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(2) ඒ නඩුවේ, ඉල්ලීමේ, අභියාචනයේ හෝ වෙනත් නඩු කටයුත්තේ පාර්ශවයක් විසින් ඒ මාර්ගෝපදේශයේ, විධානයේ, චක්‍රලේඛයේ, දැන්වීමේ හෝ තීරණයේ ආවේශ්‍යතාව අභියෝගයට ලක් කරන අවස්ථාවක දී එය ඔප්පු කිරීමේ භාරය එහි ආවේශ්‍යතාව අභියෝගයට ලක් කරන පාර්ශ්වය වෙත විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "රජය" යන්නෙන්, (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ කොවිඩ්-19 රෝගය සම්බන්ධයෙන් සාදන ලද යම් නියෝගයක අර්ථ නිරූපනය කර ඇති පරිදි වන යම් නිසි බලධරයකු අදහස් වේ.".

"වගන්තිය දෙවැනිවර කියවිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය " ,යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තෙවැනිවර කියවිය යුතු යැයි" අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තෙවැනිවර කියවා සභා සම්මත කරන ලදී.

11. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1): මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 05 දිනැති අංක 2222/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2): මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 22 දිනැති අංක 2224/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13. රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 1): මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ, ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2021. 08. 04 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2021 අප්‍රේල් 22 දිනැති අංක 2224/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14. රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 2): මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ, ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2021. 08. 04 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2021 මැයි 17 දිනැති අංක 2228/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15. දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,——

දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) එහි සභාපතිවරයා අග්‍රාමාත්‍යවරයා විය යුතු ය.

(ආ) එම කාරක සභාව තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (5) සමන්විත විය යුතු ය.

(ඇ) පාර්ලිමේන්තුව විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම කාරක සභාවේ කර්තව්‍යය විය යුතු ය.

(ඈ) එහි සාමාජික මන්ත්‍රීවරයන්ට අමතරව ඕනෑම මන්ත්‍රීවරයකුට කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.

(ඉ) කාරක සභාව අවශ්‍යතාවය මතුවන පරිදි රැස්විය යුතු අතර, රැස්වීමේ දින සිට හැකිතාක් ඉක්මනින් ඊට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

(ඊ) කාරක සභාවේ රැස්වීම් කැඳවීම අග්‍රාමාත්‍ය ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කරනු ලැබිය යුතු ය.

3. එකී කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද; සහ

(ඇ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද

බලය තිබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16. කල් තැබීම: එකල්හි වේලාව අ.භා. 4.30 පසු කර තිබුයෙන් අ.භා. 4.59ට අද දින සභා සම්මතිය අනුව කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව 2021 සැප්තැම්බර් 06 සඳුදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.